Welcome

# LakRuhunu

Get more to your Life….

Welcome

# LakRuhunu

PANSALA E - PUDLISHING

ආයුබෝවන්...

# ලක්රුහුණු

විද්‍යුත් මාධ්‍ය ප්‍රකාශණ

LAKRUHUNA

චතුරාර්ය සත්‍යාවබෝධයට ධර්ම දේශනා....

# සිත සනසන අමාගඟුල

කපුගම සුධර්මාරාමාධිපති
මාතර ශ්‍රී සුදර්ශි පිරිවෙනේ පරිවේනාධිපති ශාස්ත්‍රපති විචිත්‍ර ධර්ම දේශක

## පූජ්‍ය කපුගම සුගතසාර හිමිපාණෝ

විසින් පවත්වන ලද වැඩසටහන් වලදී දේශනා කරන ලද සූත්‍ර දේශනා ඇසුරෙනි.

පරිගණක අකුරු සැකසුම : W. S. A. ඉෂාරා දෙව්මිණී

පිටකවර නිර්මාණය :ලක්රුහුණ.com

ප්‍රකාශනය : ලක්රුහුණ.com

මුද්‍රණය :

සිත සනසන අමාගගුල

නමෝ තස්ස භගවතෝ අර්හතෝ සම්මා සම්බුද්ධස්ස !!!

## කීකරු ඇතෙක් වී යායුතු තැනට යමු.

(අංගුත්තර නිකායේ සෝතාර සූත්‍රය ඇසුරෙනි)

*සිත සනසන අමාගඟුල*

කාරුණික පින්වත්නි,

අද පොසොන් පුර පසලොස්වක පොහොය දිනයයි. මිහිඳු මහ රහතන් වහන්සේ අද වැනි දිනක අප ශ්‍රී ලංකාවට වැඩම කළේ විභජ්ජවාදය නම්වූ බුදුදහම හඳුවා දීම සඳහායි. ලෝකයේ ඇතිවන සියළුම ප්‍රශ්නවලට හේතුව ආත්මවාදී චින්තනයයි. මේ ලෝකය තුළ පවත්නා භෞතික හා මානසික සියලු දේ එකක් හැටියට ගෙන ඒවා මමය ඒවා මාගේය යනුවෙන් ස්ථිර දේ හැටියට ගෙන ක්‍රියා කිරීම ආත්මවාදී චින්තනයයි. චංචල ලෝකයෙහි යමෙකු එවැනි නිශ්චල තීරණයකට එළඹේ නම් ඔහු විචාර බුද්ධියෙන් සමුගත් අයෙකු ලෙස දැක්විය හැකිය. විභජ්ජවාදයෙහි අරමුණු සියලු භෞතික හා මානසික දේ බෙදා දැක්වීමයි. බුදුරජාණන් වහන්සේ උගන්වා වදාළ එම බෙදා දැක්වීම සියළු ප්‍රශ්න නිරාකරණය කර ගැනීමට උපයෝගී කරගත යුතුයි. මිහිඳු මා හිමියන් දෙවන පෑතිස් රජු ඇතුළු සිරිලක් වැසියන්ට දේශනා කළ විභජ්ජවාදය නම් වූ බුදු දහම අපේ ජීවිතවලට ඇතුළත් කරගෙන යා යුතු තැනට යාමට අදිටන් කර ගත යුතුය.

මිහිඳු මාහිමියන් චුල්ලහත්ථි පදෝපම සූත්‍රයේ දී ඇතෙකු උපමා කරගෙන දෙසූ ධර්මය තුළින් ලක්වැසියනට නිවන් මග හෙළි කළහ. මෙම ධර්ම පත්‍රිකාව තුළින්ද අප බලාපොරොත්තු වන්නේ ඇතෙකු උපමා

කොට ගෙන සදහම් පණිවිඩයක් ලබා දීමටය. අංගුත්තර නිකායේ පඤ්චක නිපාතයේ රාජ වර්ගයේ එන සෝතාර සූත්‍රය පැහැදිලි කරන්නේ ඇතෙකු උපමා කරගෙන බෞද්ධයා යා යුතු තැනට යන හැටියි.

බුදුරජාණන් වහන්සේ භික්ෂූන් අමතා දේශනා කරන්නේ මහණෙනි එක්තරා රජෙකුට ඉතා වටිනා ඇතෙක් සිටි බවයි. ඇතා කොහොමත් වටී. නමුත් මේ ඇතා කොතරම් වටිනවාදැයි කිව හොත් රජතුමා මේ ඇතා සැළකුවේ තමාගේ අඟ පසඟ හැටියටයි. එසේ වීමට හේතුව මේ ඇතා ඉතා කීකරු ඇතෙක් වීමයි.

**සෝතාර සූත්‍රය දක්වන පරිදි මේ ඇතා ළඟ ගුණධර්ම 5 ක් වෙයි.**

**"ඉධ භික්ඛවේ රඤ්ඤෝ නාගෝ සෝතාච හෝති. හන්තාච, රක්ඛිතාච, ඛන්තාච, ගන්තාච"**

"මහණෙනි රජුගේ මේ **ඇතා අසයි. නසයි, රැකෙයි, ඉවසයි, යායුතු තැනට** යයි. මේ කරුණු පහ නිසා මෙම ඇතා ඉතා වටිනා ඇතෙකු වී තිබේ. සොතාර සූත්‍රය දක්වන පරිදි මේ ඇතා ළඟ තිබෙන එම ගුණ ධර්ම 5 විස්තර කරදීම ගිහි පැවිදි අප කාගේත් ජීවිත සඵලකර ගැනීමට හේතු වෙයි.

මේ ඇතා ළඟ තිබෙන මුල්ම ගුණය" අසයි "යන්නය . මේ ඇතා ඇත් ගොව්වා කියන වචන හොඳින් අසයි. ඇත් ගොව්වා ඇතාට මෙසේ කියයි. " මෙය කළ යුතුයි. මෙය නොකළ යුතුයි. මෙතනින් යා යුතුයි, මෙතනින් නොයා යුතුයි." යනුවෙනි. ඒ සියළු අවවාද හොඳින් ඇසීම පළමු ගුණයයි. (සෝතාච හෝති)

ඇතා ළඟ තිබෙන දෙවන ගුණය "නසයි" යන්නය. මේ ඇතා සටනකට ගියොත් තමාට විරුද්ධව එන ඇතුන් නසයි. ඇතුන් පිට එන මිනිසුන්ද නසයි. අශ්වයින් සහ ඔවුන් බලා ගන්නා අයද නසයි සතුරන්ගේ රථ සහ එහි සිටින සියලුම මිනිසුන් ද නසයි. සිව්රඟ සෙනගේ 4 වන පාබල සේනාවද විනාස කරයි. රජතුමාට විරුද්ධව පවත්නා සියලු බලවේග විනාශ කරන බව මෙයින් කියවේ. (හනතාච හොති)

ඇතා ළඟ තිබෙන තුන්වන ගුණය "රැකෙයි" යන්නයි. කොතරම් බිහිසුනු යුද්ධයකට ගියත් මේ ඇතා තම ශරීරය රැකගනී. ශරීරයේ ඉදිරිපස පසුපස රැක ගනී කිසිදු ඉන්ද්‍රියකට හානියක් සිදුනොකර ගනී. (රකඛිතාච හොති)

මේ ඇතා ළඟ තිබෙන සිව්වන ගුණය " ඉවසයි" යන්නයි. යුද්ධ වලදී කඩු පහර, ඊ පහර, විවිධ කර්කෂ ශබ්ද ආදී දේවල් වලට මුහුණ දීමට සිදුවෙයි. එවැනි කෙතෙක් ප්‍රශ්න ආවත් ඒ සියල්ල ඉවසා ගෙන සිටීම එම ලක්ෂණයයි. (ඛනතාච හොති)

ඇතා ළඟ තිබෙන පස්වන ගුණය "යායුතු තැනට යාමයි" මොන තරම් බිහිසුනු සටනක් උවද හැම සටනකින්ම රජතුමාට ජයග්‍රහණයක් ලබාදීම මේ ඇතාගේ කාර්යයයි. (ගනතාච හොති)

බුදුරජාණන් වහන්සේ මේ ගාථාව දේශනා කොට භික්ෂූන්ට මතක්කර සිටින්නේ ඒ ගුණවලින් යුක්ත ඇතා මෙන් භික්ෂු ජීවිතයද සකස්කර ගත යුතු බවයි. භික්ෂූන් වහන්සේලා හැටියට අප සියලුම දෙනාගේ පියා බුදුරජාණන් වහන්සේය. ඒ පියාගේ වචන හොඳින් ඇසිය යුතුයි. නොකළ

යුතුයයි යමක් නිර්දේශකොට ඇත්නම් ඒවා අසාගෙන ඉන් මිදිය යුතුයි. කළ යුතු යමක් නිර්දේශ කොට ඇත්නම් ඒවා අසාගෙන ඉන් මිදිය යුතුයි. (අසයි)

මෙසේ පියාගේ වචනයට අනුව ක්‍රියා කරන විට ඊට විරුද්ධ බල වේග ගිහි පැවිදි දෙපක්ෂයෙන්ම පැමිණිය හැක. එම විරුද්ධ බල වේග හඳුනාගෙන ඒවා නසා දැමිය යුතුයි. (නසයි) භික්ෂුව තම ජීවිතය ආරක්ෂා කර ගත යුතුයි. තම ශරීරය මෙන්ම තම ශීලයද ආරක්ෂා කර ගත යුතුයි. (රැකෙයි) භික්ෂුවගේ ජීවිතය රෝස මල් යහනාවක් නොවේ. විවිධ ප්‍රශ්න හා ගැටළු එම ජීවිත තුලත් දැකිය හැකිය. ඒවා සිහිනුවනින් ඉවසිය යුතුයි. (ඉවසයි) එසේ ක්‍රියා කරන භික්ෂුවට යායුතු තැනට යාමට පුලුවන. සමාජයට වැඩදායක භික්ෂුවක් හැටියට සමාජ සේවයක් කළ හැකි අතර සසර ගමන කෙළවර කොට නිවන් සම්පත්තියද ලබා ගත හැක. එවැනි භික්ෂුවක් වේ නම් ඒ භික්ෂුව සමාජය ආරක්ෂා කරයි. නැත්නම් සමාජයෙන් ප්‍රතික්ෂේපවී යයි.

මේ කියන ලද ධර්ම පර්යාය සමාජයේ හැම කෙනෙකුටම ප්‍රායෝගිකව පුරුදු පුහුණු කළ හැක. මේ සදහම් පුෂ්පය කියවන ඉගෙනුම ලබන දරුවන් මේ කරුණු පහට අනුව ක්‍රියාත්මක වී හොඳ අයෙක් වීමට සිතා ගත යුතුයි.

ඉගෙනුම ලබන දරුවන්ගෙන් ඇසුවොත් ඔබ අනාගතයේදී කොයි විදියේ කෙනෙකුවෙන්නට බලාපොරොත්තු වෙන් සිටීද කියා බොහෝ

දෙනාගේ පිළිතුර දොස්තර වරයෙක් හෝ දොස්තර වරියක් කියාය. ඒ එම දරුවන් යා යුතු තැනයි. පස්වන කරුණයි. එතනට යාමට නම් දරුවනේ මුලින් කී කරුණු හතර අපේ ජීවිතයේ තිබිය යුතුයි. ඉගෙනුම ලබන දරුවන් දෙමාපියන්ගේ අවවාද ඇසිය යුතුයි. ගුරුවරුන්ගේ අවවාද ඇසිය යුතුයි එසේ ගුරු දෙගුරු බසට සවන් දී ක්‍රියා කරන දරුවන් එයින් වෙනස් මගකට ගෙන යාම සඳහා හතුරු බලවේග ඉදිරිපත් විය හැකිය. සමහර විට තම හිතවතුන්ම එසේ සතුරන් ලෙස ක්‍රියා කළ හැකියි. ඔවුන් හදුනාගෙන ඔවුන්ගෙන් ඈත්වී ක්‍රියා කළ යුතුයි. තම අදහසට අනුව වෙනස් කර ගැනීමට බැරිවූ විට ඔවුන් අපේ ජීවිත වලට කරදර කිරීමට ඉදිරිපත් විය හැක. ඒවායින් තම ජීවිතය ආරක්ෂාකර ගත යුතුයි. කන බොනදේ පිළිබඳවද එවැනි අය යමක් දුනහොත් ප්‍රවේශම් විය යුතුයි.

ශිෂ්‍ය ජීවිතය තුළ විවිධ බාධා කරදර ඇතිවිය හැකිය. ආර්ථික දුෂ්කරතා ඇති දරුවන්ට විවිධ අඩුපාඩුකම් ඇතිවිය හැකිය. ඒ සියල්ල ඉවසා දරාගෙන කටයුතු කළ යුතුයි.එසේ කටයුතු කළොත් දොස්තර මහතෙකු හෝ දොස්තර නෝනා කෙනෙකු විය හැකිය. ඒ යා යුතු තැනයි. අපේ දරුවන් එසේ යා යුතු තැනට ගියොත් අර රජතුමාට ඇතා නැතිවම බැරි උනාසේ අපටත් ඒ දරුවන් නැතිවම බැරි පිරිසක් බවට පත්වේ. එසේ ක්‍රියාත්මක නොවී ක්‍රියා කළොත් ඒ දරුවන් සමාජයෙන් ප්‍රතික්ෂේප වී යයි. බොහෝ විට දේවාල පසුපස ගමන් කරන්නෝ එවැනි දරුවන්ය.

අපේ සමාජය තුළ ජීවත්වන තරුණ තරුණියන්ටද යායුතු තැනක් තිබේ. ඒ තැන කුමක්ද? මනා පෞරුෂයක් ඇති තරුණයෙක් හා තරුණියක් ලෙස විවෘත ජීවිතයක් ගත කළ යුතුයි. ඒ තැනට යාමට නම් මුලින්ම කී කරුණු හතර ඒ තරුණ ජීවිත වලින් අවංකවම ප්‍රදර්ශණය විය යුතුයි. නමුත් අද බොහෝ තරුණ දරුවන්ගේ දෙමාපියන් කියා සිටින්නේ අපේ දරුවන් කුඩා කළ කියනදේ ඇසුවත් දැන් නො අසන බවයි. එය නොවිය යුත්තකි. තරුණ දරුවන් දෙමාපියන් හා වැඩිහිටියන් කියන හොඳ දේ ඇසිය යුතුයි. තම තරුණ ජීවිත වලට එළඹෙන සතුරු බලවේග නසා දැමීය යුතුයි. එසේ ක්‍රියාත්මක වී තම වටිනා තරුණ ජීවිතය ආරක්ෂාකර ගත යුතුයි. තරුණ තරුණියන්ට සමාජය තුළ විවිධ ප්‍රශ්න ඇතිවිය හැකිය . ඒ සියලු ප්‍රශ්න ඉවසා දරා සිටිය යුතුයි. එසේ ක්‍රියා කළහොත් මනා පෞරුෂයක් ඇති තරුණයෙක් හා තරුණියක් ලෙස විවෘත ජීවිතයක් ගත කළ හැක. එවැනි ජීවිත සමාජය අපේක්ෂා කරන අතර එසේ සකස් නොවූ අය සමාජයෙන් ප්‍රතික්ෂේපවී යයි. තම තරුණ දුවට හෝ පුතාට ආවාහයක් විවාහයක් කරදීමේදී බොහෝ දෙමාපියන් අසීරු තත්වවලට පත් වන්නේ තම දුව හෝ පුතා යා යුතු තැනට නොයෑමයි. එවැනි තැන්වල එම ඥාතීන්ට උපදෙස් දෙන්නේ මග කොතනකවත් නොබැස ගෙදරටම එන ලෙසයි. අතර මග බැස කෙනෙකුගෙන් ඇසුවොත් ඒ පිරිස ගෙදරට වාහනයෙන් 60 වේගයට ආවා නම් නැවත වාහනයට නැගී 120 වේගයෙන් ගෙදරට යනු ඇත. අපේ ගෙදර සිටින තරුණයා හෝ තරුණිය යායුතතු තැනට ගොස් තිබේ නම් සැගවීමට දෙයක් නැත. කාගෙන් ඇසුවත් බිය වීමට අවශ්‍ය නැත. එසේ යායුතු තැනට ගොස් ඇති තරුණ තරුණියන්

සමාජය අපේක්ෂා කරයි. එසේ නොමැති අය සමාජයෙන් ප්‍රතික්ෂේප වී යයි. එවැනි තරුණ තරුණියන් දේවාල පසු පස යමින් යාඥා කරනු දැකීම බෞද්ධකමට නොගැලපේ.

සමාජය තුළ අඹු සැමියන් හැටියට ජීවත්වන අයටද යායුතු තැනක් තිබේ. ඒ තැන කුමක්ද? දෙවියකු සහ දෙවඟනක ලෙස ක්‍රියා කිරීමයි. බුදු දහම උගන්වන වැදගත්ම විවාහ ජීවිතය එයයි. ඒ යායුතු තැනට යාමට නම් ඔවුන් ලඟද අර මුලින් කී කරුණු හතර ක්‍රියාත්මක විය යුතුයි. බෞද්ධ ගෙදරක ජීවත්වන අඹු සැමි දෙපළ බුදුරජාණන් වහන්සේ දේශනා කළ ධර්මය ඇසිය යුතුය. උත්සාහයෙන් කටයුතු කොට දැහැමි ධනයක් උපයා ගත යුතතු අතර, ඒ ධනය හොඳින් ආරක්ෂා කර ගත යුතුයි. හොඳ මිතුරන් ඇසුරු කළ යුතු අතර ලැබෙන ප්‍රමාණය ගැන සිතා වියදම් කළ යුතුයි. ණය නොවිය යුතුයි. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේදී මෙලොව දියුණුව සඳහා දේශනා කළ එම කරුණු හොඳින් ඇසිය යුතුයි. එසේ අසා ඒවාට අනුව කටයුතු කරන විට විවිධ හතුරන් පැමිණිය හැකිය. තම සැමියා ගෙදර නැති විටෙක කෙනෙක් ඇවිත් මෙසේ ඇසිය හැක. බලන්න ඔබේ ඇගේ දැලි අපේ ඇගේ දැලි නැත. අපි ඉවුම් පිවුම් කරන්නේ ගෑස් වලිනි. මේ ඇවිත් තිබෙන්නේ හතුරෙකි. ඒ හතුරා නැසිය යුතුයි එහිදී මෙසේ කිව යුතුයි මමනම් ගෑස් වලින් උයන්න කැමතියි. නමුත් අපේ මහත්මා කැමති මැටි හට්ටිවල දරලිපේ උයන කෑම වලටයි එසේ කියා හතුරා නැසිය යුතුයි. තව හතුරෙක් ඇවිත් මෙසේ ඇසිය හැක. තාමත් බලන්නේ කළු සුදු රූපවාහිනියද බලන්න අපේ ගෙදර වර්ණ රූපවාහිනියක් ගෙනාවා මේද

හතුරෙකි. ඔහුට මෙසේ කිව යුතුයි. මම නම් වර්ණ රූපවාහිනියට කැමතියි නමුත් අපේ මහත්මා කැමති කළු සුදු එකට නේ මෙසේ හතුරන් නැසිය යුතුයි. එවැනි අය තම අදසට නතු කර ගැනීමට නොහැකි වූ නිසා විවිධ කරදර කළ හැක. ඒවායින් ආරක්ෂා විය යුතුයි. ගිහි ගෙදර යනු ගිනි ගොඩකි. මේ ගිනි නැමති කරදර සියල්ල ඉවසිය යුතුයි. මෙසේ ක්‍රියා කරන අඹු සැමියන් තම ගෙදර දේවාලයක් කරගෙන දෙවියෙක් හා දෙවඟනක් ලෙසින් දේව දරුවන් සමග සතුටින් ජීවත්වේ.

නොබෝ දිනක ගෙදරක දානයට ගියෙමි දානයේ නිමිත්ත කුමක්ද? ඒ දෙදෙනා විවාහ වී අවුරුදු 50 ගතවීමයි. දෙදෙනා එක පැදුරේ එක ලඟ වාඩිවී සිටී.දරුවන් හා දරුමුනුබුරන් වටේට වාඩිවී සිටිති. අපිට ඒ දර්ශණය පෙනුනේ සුදුපාට කොළ අලවා පැටව් සහිතව එල්ලා තිබෙන අට පට්ටම් කූඩුවක් ලෙසිනි. මෙහිදී ඒ දෙදෙනා සමාජයට දෙන පණිවිඩය කුමක්ද? අපි දෙදෙනා මීට අවුරුදු 50 පෙර පොතක අත්සන් තබා දිවි ඇති තෙක් සමගියෙන් සිටින බවට පොරොන්දු වීමු. එදා තිබූ ආදරය අදත් එසේමය. කොතරම් වටිනා ජීවිත දෙකක්ද. එසේ වූයේ යායුතු තැනට ගොස් ඇති නිසාය සමහර තැන්වල විවාහ වූ දිනවල තද වැස්සේ උවද ඉතාම කුඩා කුඩයක් යටට වී දෙදෙනා ම නොතෙමී යති. විවාහයෙන් අවුරුදු දෙක ගතවී ගිය පසු මද වැස්සක උවද ලොකු කුඩයකින්වත් නොතෙමී යාමට බැරිය. හේතුව යායුතු තැනට නොයාමයි. දේවාල පසු පසු පූජාවට්ටි ගෙන යදින්නේ එවැනි අඹුසැමියන්ය.

ඉහත කී මේ ධර්ම පරියාය ගිහි පැවිදි බෞද්ධයන් හැටියට මෙසේ ක්‍රියා කළ යුතුයි. අපි සියලු දෙනාම  බෞද්ධයින් හැටියට බුදුන්වහනසේගේ වචනය ඇසිය යුතුයි. තමා ඉදිරියට එන කෙලෙස් නැසිය යුතුයි. තමන්ගේ ඇස කණ ආදී ඉඳුරන් අරක්ෂා කරගත යුතුයි. ගිහි පැවිදි ජීවිත වලට එන සියලුම ප්‍රශ්න ඉවසා ක්‍රියා කළ යුතුයි. එසේ වූ කළ සසර ගමන නතර කොට නිවන් සැපත උදාකර ගත හැක. කීකරු ඇතෙක් වී මෙසේ යායුතු තැනට යාමට අධිෂ්ඨාන කර ගනිමු.

සැමට තෙරුවන්සරණයි

සාදු ! සාදු !! සාදු !!!

සිත සනසන අමාගගුල

www.lakruhunu.com